# PEOPLE'S SPARK ණය යෝජනා ක්‍රමය

PEOPLE'S BANK
Pride of the Nation

'People's SPARK' ණය යෝජනා ක්‍රමය කෘෂිකර්මාන්තය, ආහාරපාන නිෂ්පාදන, නවෝත්පාදන, සංචාරක සහ අත්‍යවශ්‍ය සේවා (සෞඛ්‍යය,අධ්‍යාපන, සැපයුම්, ටෙලිකොම්) සඳහා ප්‍රමුඛත්වය දෙමින් ව්‍යාපාර ආරම්භ කිරීම හෝ පුළුල් කිරීම සඳහා පුද්ගලයින්ට සහ ව්‍යාපාර වලය සහාය ලබාදෙනු ලබයි. ප්‍රජාව තුළ නව ව්‍යාපාර සංවර්ධනය කිරීම දිරිමත් කිරීම සහ සහාය දීම මගින් ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණ වේ. මෙම ණය යෝජනා ක්‍රමය මගින් ව්‍යාපාරයන්හි ආයෝජන සහ ස්ථාවර කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සඳහා මූල්‍යයනය කරනු ලබයි.

**විශේෂ ප්‍රතිලාභ**

- තරඟකාරී පොලී අනුපාත
- නම්‍යශීලී ආපසු ගෙවීමේ සැලසුම්
- අවශ්‍ය නම්, මුල් ණය මුදල ආපසු ගෙවීම ආරම්භ කිරීම සඳහා සහන කාලයක් සලකා බැලිය හැක.
- අවම ලියකියවිලි
- ලිහිල් කොන්දේසි

**යෝග්‍යතාව**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ/ උසස් පෙළ විභාගය හෝ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කොමිෂන් සභාව යටතේ පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් සම්පූර්ණ කර තිබීම හෝ වෘත්තීය පුහුණු සුදුසුකමක් හෝ NVQ 5 මට්ටමට සමාන හෝ ඊට වැඩි වෙනත් අධ්‍යාපන හෝ වෘත්තීය සුදුසුකම් සපුරා ඇති පුද්ගලයෙකු වීම.
- වයස අවුරුදු 20-45 විය යුතුය.
- මහජන බැංකුවේ හෝ වෙනත් මූල්‍ය ආයතනයක ණය පැහැරහරින්නෙකු නොවිය යුතුය.
- ශක්‍යතාවයකින් යුතු ව්‍යාපාරයක් තිබිය යුතුය.
- ප්‍රධාන වශයෙන් ගණුදෙණුකරුගේ ආපසු ගෙවීමේ හැකියාවට යටත්ව පහසුකම් සලකා බැලිය හැකිය.

**ණය මුදලේ ප්‍රමාණය**

- උපරිම ණය මුදල එක් ගණුදෙණුකරුවෙකු සඳහා රු.මිලි. 2.5

▼

**පොලී අනුපාතය**

- මහජන බැංකුවේ වෙබ් අඩවිය -www.peoplesbank.lk වෙත පිවිස තොරතුරු ලබාගත හැක.

**ආපසු ගෙවීමේ කාලය**

- ආයෝජන ණය පහසුකම් - වසර එකක (1) සහන කාලයක්ද (අවශ්‍ය නම්.) ඇතුළුව උපරිම වසර 7කි.
- කාරක ප්‍රාග්ධන ණය පහසුකම්- මාස හයක (6) සහන කාලයක්ද ඇතුළුව උපරිම වසර 3කි. (අවශ්‍ය නම්.)
- ව්‍යාපාරයේ ආදායම් රටාව අනුව මාසිකව, මාස දෙකකට වරක් හෝ මාස තුනකට වරක් වාරික වශයෙන් ගෙවීම් කළ හැක.

**ගාස්තු, කොමිස්, පොලී ආදිය**

- ස්ථාවර සහ විචල්‍ය පොලී අනුපාත
- හිඟ වාරික සඳහා දඩ පොලිය
- සම්මත ණය සැකසුම් ගාස්තු
- ගිවිසගත් කාලයට ප්‍රථම ණය මුදල ගෙවා අවසන් කිරීමේදී අයකරනු ලබන ණය මුදල් කලින් පියවීමේ ගාස්තු
- තක්සේරු ගාස්තු (අදාළ නම් පමණක්)
- නීති ගාස්තු (අදාළ නම් පමණක්)
- රජයේ මුද්දර ගාස්තු (අදාළ නම් පමණක්)
- රක්ෂණ වාරික (අදාළ නම් පමණක්)

**අයදුම් කිරීමේ ක්‍රමය**

- මහජන බැංකුව වෙබ් අඩවිය හරහා විද්‍යුත් ණය අයදුම්පතක් ලෙස අයදුම් කළ යුතුය.
- පත්තර දැන්වීම් වල ඇති QR කේතය ස්කෑන් කිරීම මගින්ද අයදුම් කළ හැක.

**නියමයන් සහ කොන්දේසි**

- වත්මන් ව්‍යාපාර කාර්ය සාධනය සහ මූල්‍ය ඇගයීමට යටත්ව ණය පහසුකම් සලකා බලනු ලැබේ.
- මූල්‍ය පහසුකම් සලකා බැලීමේදී බැංකුවට පිළිගත හැකි සුරැකුම් ලබාදීම සාමාන්‍යයෙන් ගණුදෙණුකරුවන්ගෙන් අපේක්ෂා කරනු ලැබේ.
- ණය පහසුකම් සලකා බැලීමේදී බැංකුවට පිළිගත හැකි අභ්‍යන්තර බැදීම් සහ ණය තොරතුරු කාර්යාංශ බැදීම් (CRIB) පරීක්ෂා කරනු ලැබේ.
- ණය පහසුකම් සම්බන්ධ තොරතුරු නියමයන් සහ කොන්දේසි කාලීනව වෙනස්වීම් වලට ලක්වේ. එබැවින් නවතම තොරතුරු, නියමයන් සහ කොන්දේසි පිළිබඳ දැනුවත් වීම සඳහා ආසන්නතම ශාඛාව සම්බන්ධ කරගැනීම සුදුසුය.

**පැමිණිලි හැසිරවීමේ ක්‍රියාපටිපාටිය**

- ගණුදෙණුකරුවන්ට info@peoplesbank.lk හරහා පැමිණිලි අප වෙත යොමු කළ හැකිය.
- අදාළ ශාඛාව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රධාන කාර්යාලය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැක.
- අදාළ ශාඛාව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රධාන කාර්යාලය වෙත ඇමතීම මගින්ද පැමිණිලි ඉදිරිපත් කළ හැක.

වැඩිදුර තොරතුරු

- **ඇමතුම් මධ්‍යස්ථානය** - 1961
- **ප්‍රධාන කාර්යාලය** - 0112481481
- **සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඒකකය** - 0112481356